දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
DISTANCE AND CONTINUING EDUCATION UNIT – UNIVERSITY OF RUHUNA

ප්‍රථම ශාස්ත්‍ර (බාහිර) පරීක්ෂණය - 2014 අප්‍රේල්
First Examination in Arts (External) - April 2014

# සිංප්‍ර 1.2 - සාහිත්‍ය පරිචය
# SL 1.2 – Competence of Literature

කාලය පැය තුන යි

**පළමු වෙනි ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.**
**(නොපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කෙරේ)**

---

(01) (අ) i. පහත සඳහන් ඡේදය ලිහිල් බසින් ලියන්න.
ii. අංකිත පදවලට කෙටි විවරණ සපයන්න.

සතළොස් වැනි වූ උයනින් විමැසූ ප්‍රශ්නය කෙසේ ද යත් :- නැවැත එක් දවසක්, "අපි උයන් කෙළි කෙළනා කමැත්තම්හ; අපගේ උයන පරණ වැ ගියේ ය; යව මැදුම් ගම්වැස්සෝ චම්පකාශෝකවකුලතිලකාදීන් සුපුෂ්පිත තරුවරාකීර්ණ අලුත් උයනක් එවත් ව" යි කියා යැවූහ. පණ්ඩිතයන් වහන්සේ, "මෙයින් සමාන පැනයෙකින් ම විසඳිය යුතු යැ" යි ගම් වැස්සන් අස්වසා, මුබරි මිනිසුන් කීප දෙනකුන් යවා, පෙර පොකුණට කියා යැවූ පරිද්දෙන් ම කියා යැවූ සේක. එ දවසුත් රජ්ජුරුවෝ සතුටු වැ සේනක පණ්ඩිතයනට කියන්නාහු "පණ්ඩිතයන් ගෙන්වා ගනුමෝ දැ" යි විචාළහ. ඒ තෙමේ ලාබමාත්සර්යය නිසා "මෙ පමණෙකින් ම පණ්ඩිත නම් නො වෙති; හැම්මුන මැනවැ" යි කී ය.

උම්මග්ග ජාතකය
(සංස්), සුචරිත ගම්ලත්
(ලකුණු 10 යි)

(ආ) i. පහත සඳහන් පද්‍යවල අර්ථ ලිහිල් බසින් ලියන්න.
ii. අංකිත පදවලට කෙටි විවරණ සපයන්න.

නොමඳ රැසින් රැඳුණු අවට
ක ර ද කුසුම් දක තුරු යට
වි ල ද වෙදැයි සිත සැක කොට
සබඳ ගොසින් නො වන් නිවට

වි සි ර හෙන ගඟුලැලි වැදේ
තවර ගෙන මල් මුවරදේ
බ ම ර රැවු ඇද මඳ මදේ
පැතිර එන මඳ නල විදේ

ගි ම න දුර පලවන නිසා
ස ල න මිණි තල් වට ලෙසා
යනෙ'න යුග පිය පත් ගසා
ද කි න සිය සියොතුන් රැසා

ගිරා සන්දේශය (සංස්), සුචරිත ගම්ලත්
(ලකුණු 10 යි)

(ඇ) පහත දැක්වෙන පද්‍ය පන්තිය විචාරයට ලක් කරන්න.

ග ලා කඳුළු වැටෙමින් ඇමති එම වි ට
බ ලා මගේ කුමරුන් එම් සහතිකෙ ට
වැ ඩ ලා බිසව් සිටිනා මාළිගාව ට
දැ ක ලා බිසව් සැතපෙන සැටි යහන පි ට

සි රි හස්තෙන් රන් බාපත අල්ලා ලා
සි රි පද රන් පඩි කඳ පිට තබා ලා
පි රි සිදු යහනෙ සැතපෙන පුන් සඳ ලී ලා
සි රි පද ගත්තෙ ආපසු කිසිවක් නො බ ලා

අ මු ණ ක් පමණ මල් අතුරපු යහන පු රා
ප ම ණ ක් එරුණි කුමරුට රන් කිරි තිස රා
ක ව ද ත් වරද නැති පින්කඳ යසෝද රා
ව ර ද ක් බුදු බවට පැමිණේ ය අන්ත රා

ස ත් බඹයක් නිල් වරලස මිදී ලා
අ ත් බඹරෙකු ලෙසට වරලස කැරකී ලා
සි ත් ලෙස කුමරු යහනේ කිරි බොන ලී ලා
අ ත් හැර ඉන්ට බැරි වෙයි රන් කුඹු දැක ලා

පෙරුම් පුරා ගෙන එන්නේ ඇත සි ට
පතා සතුන් දන් දුන්නේ බුදු බව ට
කතුන් සැමට නායක පුන් සඳ ලඳ ලෙස ට
ඉතින් කතා කෙරුවොත් මගෙ බිසොවුන් ට?

(ලකුණු 08 යි)

(02) 'ක්ෂත්‍රියයන් හා බමුණන් නිර්දය උපහාසයට ලක් කිරීමත්, ගොවි කුලයෙහි උපන් මහෞෂධ කුමරුගේ ප්‍රඥා මහිමය උත්කර්ෂයට නැංවීමත් උම්මග්ග ජාතකයෙහි මුඛ්‍ය අරමුණකි' නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න.

(03) 'ගිරා සන්දේශයෙහි' සන්දේශ කාව්‍ය ලක්ෂණවලට අමතර ව රාජ ප්‍රශස්තියක ලක්ෂණ ද විද්‍යමාන වේ' සනිදර්ශන ව පහදන්න.

(04) 'සරච්චන්ද්‍ර පැරණි මූලාශ්‍රයවලින් පමණක් තෘප්ත නො වී නූතන කලා නිර්මාණවලින් ද ආභාසය ලබමින් මිනිස් චරිතවල සංකීර්ණත්වය විදහා පාන නිර්මාණයක් ලෙස මනමේ ~~සිංහබාහු~~ නාටකයේ පෙළ රචනා කර තිබේ' මේ ප්‍රකාශය අදාළ නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න.

(05) ප්‍රේමයේ සත්‍යකතාවක් කෘතියේ උපයුක්ත කථන ක්‍රමය කතාවේ තේමාව උද්දීපනය කිරීමෙහි ලා කොතෙක් දුරට බලපා ඇද්ද යන වග අදාළ නිදසුන් ගෙන හැර දක්වමින් විභාග කරන්න.

(06) නිරායාස ගුණය, කලා කෘතියක සාර්ථකත්වයට හේතුකාරක වන අයුරු යසෝදරාවත ඇසුරෙන් පැහැදිලි කරන්න.

(02 සිට 06 දක්වා ප්‍රශ්නවලට ලකුණු 18 බැගින්)